

# බැතිමල්

## අපි සමරමු සම්බුද්ධ ජයන්තිය !

සුසුදු වතින් ගත සැරසී
සුපිළිවෙතින් පෙළ ගැසී
යස් අදිටනින් සිත වැසී
අරිඅටැඟි මගෙහි නිසී !

පුත දුව සොයුර නගේ
අප දිවි පෙරට නැගේ
මැදුම් පිළිවෙත් මගේ
විසුවොත් නොවෙද අගේ !

බුදුන් වදහළ නිර්මල ධර්මය
පුරා විසුළ සිරිලක දම්දීපය
තෙවරක් බුදු පා පහස ලැබූ දැය
සුරකිමු පුදදෙමු මතුවත් මෙලෙසම !

බොදු හදවත් තුළ නිරතුරු බැඳි දම
මතු දිනෙකත් එලෙසම සුරකෙන සඳ
දෙදහස් හයසිය වසක අතීතය
අපි සමරමු සම්බුද්ධ ජයන්තිය !

♦ මාලපල්ලේ
**කුමුදු රොහාන් අමරසිංහ**
**Edmonton, London, UK**

## මල් අම්මා

පාලොස්වක හඳ පායන දවසට
සිල් ඇත්තන් සිත් පීදෙන යාමෙට
දෝත පුරා සුදු ඕලු මිටින් මිට
පන්සල් දොරකඩ මල් විකුණයි නුඹ

හිතුණත් සිල් පිරුවට කර ලන්නට
දරුවන් කුසගිනි නිවන්නෙ කවුරුද
ආසාවක් තිබුණත් කප්පරකට
බණ පදයක් අහගන්නේ කොහොමද

වාරු නොලද හිමි වැල් ඇඳටම වී
පැටව් අතින් වැලි මාලිග ඉදිවී
මල් කූඩය සොච්චමට හිලව් වී
මලින් උපන් මව් බිසොවුන් ඒවී

හිමි විවරණ ලද මෙතේ බුදුන් නුඹ
දරු පිරිවර මැද ගෙදර බුදුන් නුඹ
බුදුගෙට වැඩි මල් ගානට පින් ලැබ
අම්මේ දවසක නිවන් දකී නුඹ

♦ **ශ්‍රියා කුමාරසිංහ**
**Dunedin - New Zealand**

## නමද්දිම් තිලෝනා හිමි !

සසරෙහි දිගු කලක් පෙරුමන් පුරා ගෙන
දැඩි වීරියෙන් සව් කෙළෙසුන් නසා ගෙන
ලෝනා මහිමි සම්බුදු බව ලබා ගෙන
බැබලවූ සේක ලොව වෙසගේ පොහෝ දින

තුරු අග කුසුම් පිබිදී ඇත සුවඳ පිරී
හමනා මඳ නලින් ගතසිත වෙහෙස හරී
පැතිරෙයි වෙහෙර ගංටා නාදය මිහිරී
පිබිදෙයි බොදු දනන් සිත් සැදැහෙන් ඉතිරී

තෙල් මල් දැහැත් දන් සකසාගෙන නොලසී
අරුනළු වැටෙන විට සුදු ඇඳුමෙන් සැරසී
සම්බුදු හිමි නමින් පුදකරනා විලසී
උවසුන් උවැසියෝ යති වෙහෙරට සතොසී

අනිසය දුක අනත්බව දිවියේ නොදැන
බව සයුරට වැටී එහි දන දුක් විඳින
සත ඉන් මුදාගෙන සලසා දෙන නිවන
හිමියනි අරි අටඟ මඟ පෙන්වූ කළණ

ඔබ දෙසූ ඒ උතුම් දහමෙන් සනා තන
දිවියේ නොතිරබව දැන හිත හදා ගෙන
ඔබ ගුණ රුවන් හද මැදුරේ පුරෝ ගන
වැතිරී වඳිමි පායුග හිස නමා ගෙන

අභාවප්‍රාප්ත
විශ්‍රාමික විදුහල්පතිනි
♦ **ප්‍රේමා අදිකාරි මහත්මිය**

## දම්රද තෙමඟුල

ඉපදී බුදුව පිරිනිවි සල් ගසක් යට
තෙමඟුල සිහිව එයි සිතුවිලි අවදි කොට
තුන්ලෝ සතට දුන් අමරස අගේ කොට
මේ ගුණ වැනුම කරනෙමි බුදු හිමි නමට

ජාතිය කුලය ගැන කිසිවක් නැත බැලුවේ
සැකිකුල සැඩොල් කුලදෙක එක ලෙස සිතුවේ
ප්‍රජාපතිය හා සුන්දරී දෙස බැලුවේ
එකලෙස සැමට මෙත් කුළුණැස යොමු කෙරුවේ

අසරණ සෝපාක පුතුහට පිහිට වුව
බැඳි බැමි සිඳ දමා සිත බිය දුරු කෙරුව
රාහුල පුතා ලෙස ඒ සැම ගැන සිතුව
එහෙමයි බෙදුණු සැටි බුදු ගුණ ඉම්හි රිව

අරුමැති ගුණ පිරුණු සම්බුදු පියා ණෙනී
තුන් ලෝ දනිති ඔබෙ මෙත වන් අමා පැනි
නිවනේ දොර විවරකළ දම්රදා ණෙනී
වැතිරී වඳිමි සිරිපද යුග දයා වෙනී

♦ **එස්. කංකානම්ගේ**
**London SE 5**

## බියුටි සැලොන්

මොණර පිලට නිල්වරලට වෙහෙස ගැටී
තැන තැන දැවී කළු සුදුවී පෙනෙන හැටී
පුන් සඳ වතට පොඩි පොඩි රැළි හැඩට වැටී
නීල නයන පැහැ බොරවී හඬන හැටී

නෙත් අදහන්නෙ කොහොමද රුව වියැ කෙනවා
කැඩපත ළඟදි දෙව් බුදුවරු සිහි වෙනවා
තරුණ දියණියන් ළඟ සිත සැන සෙනවා
ඔවුනුත් දිනක අප යන මග මතු වෙනවා

ගානියෙ ඔලේ ගජරාමෙට විකිණෙන වා
නම්බර් සෙවන් තරහෙට වැද වැජඹෙන වා
කපා කොටා ඇද බැඳ හම රඳවන වා
සැත්කම් ප්ලාස්ටික් වයසට පරදින වා

සොපියා ලොරෙන් මැර්ලින් ලිස් විතරක් ද
ජෝන් කොලින්ස් ළඟදී ඇස ගැටුණා ද
මන මෝහන නිම්මි මැතක දුටුවා ද
අයිශ්වර්යා රායි ඔබ මග එනවා ද

සතුටෙන් සිනහවෙන් දිවි මග සරසන් න
හිතකින් කෙරෙන පින් ඉහළින් සලකන් න
වචනෙන් ගතින් පවකට ඉඩ නොම දෙන් න
දැහැමෙන් ඉන්න කුහකත්වය දුරලන් න

ගී පදයක් දෙකක් නිතරම මුමු ණන්න
සෝබා දහම හා කුළුපග වී ඉන්න
සුන්දර හැඟුම් සිතුවිලි පුරවා ගන්න
තාරුණ්‍යයට ඉඳ හිට ගොස් ගැව සෙන්න

♦ **ලිලානි පෙරේරා**
**Essex UK**



සොෆියා ලොරේන් - එදා



සොෆියා ලොරේන් - අද



## බුදුවෙන හිත

සියලුම බුදුවරුන් නිරතුරු වැඩ ඉන්නේ
අප හිත තුළම බව බොහොදෙන නැත දන්නේ
සිතුවිලි යටයි බුදුවරු නොපෙනී ඉන්නේ
නොහිතන මොහොතකයි කවුරුත් බුදු වෙන්නේ

දුක ඇතිවෙන්නෙ හිතෙනා සිතුවිලි වලිනී
සිතුවිලි නැතොත් සිතකට දුක නැත එවැනී
සිතුවිලි පහළවන්නේ සිත තුළ මෙවැනී
තණ්හාවන් නමැති ආසාවන් මගිනී

තණ්හාවන් නැතොත් සිතුවිලි නිපද වන
සිත තුළ ඇත්තෙ නිවනකි දුක් ගිනි නිවෙන
ඒ නිවනට මගත් ලොවුතුරු සුව ගෙනෙන
ඇත්තේ සිත තුළයි හැම දුක ජනිත වෙන

දුකත් හේතුවත් නිවනත් මගත් කියා
ඇතිමුත් හතර ඇත්තක් බුදු දහමෙ කියා
ඒ හතරම එකට ගත හැකි වන්නෙ හොයා
අප සිත තුළින්මය වෙන කිසි අතක නොයා

දුක් වින්දත් නිවන අප තුළ බව නොදක
හොඳහැටි අපේ හිත වටහාගත් දිනක
අපටත් නිවන් දකගෙන බුදුවිය ඇහැක
නිවනයි හැබෑ තත්වය දුක නැති හිතක

අපගේ පියවි පිරිසුදු හිත එළිය දිදී
බබළයි කෙලෙස්බර සිත් නැති විටදි හැදී
ඒ එළියටත් නොඇලෙන හිත දුකෙන් මිදී
අජරාමර සුවය වළඳයි නිවන් වැදී

♦ **මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම**
**Harrow UK**

## ජීවිත රහස

සූසැට කලාවේ පුහුණුව පිණිස කියා
නිගමනයකින් පිළියෙල කළ පරිදි පියා
යමුනා ගඟබඩට ගුරුදේවයෙකු සොයා
පස් හැවිරිදි වියේ සිදුහත් කුමරු ගියා

රන් රිදී මැණික් ගිල්වූ පුවරුවෙක පිට
දවසක් අකුරු ලියමින් සිටි කුමරු හට
යම්කිසි දුබල කෙඳිරිල්ලක් එකතු කොට
දැවටෙන හඬක් දැනුණා කන් සිදුරු යට

රුක් බිලයකින් එළියට බැස සිටින තැන
ලස්සන කුරුළු පැටවෙකු දැක හොටට ගෙන
ඌ මර බියෙන් මිරිකා ලේ වගුරු වන
කපුටෙක් වැසුවේය අත්තක ඉවුරු කොන

කැට පහරකින් කපුටා බියකොට එළවා
අසරණ සතා අන්තිම මොහොතෙදි ගළවා
මහබෝසත් කුමරු අත්පොඩි උඩ නළවා
ගුරු වෙත ගෙනගියේ ඌ වෙත හිත අළවා

පැන් කඳුලකින් අන්තිම පිළියම දුන්නා
අත්තටු සළා පැටවා නිහඬව උන්නා
ගුරුගේ මුව ගැබින් ඒ සලකුණ දන්නා
"සිදුහත් ඌ මළා" යන හඬ පිට පැන්නා

"ආ ගුරුතුමනි ඒ ඇයි ඌ මොකද මළේ ?"
"සිදුවුණු තුවාලය බලවත් හෙයිනි ගෙලේ"
"නැත්නම් නැද්ද ?" "නැහැ? එහෙනම් මෙබඳු පෙලේ
උවදුරු නොලැබ නොමැරෙත්ම ද කුරුළු නලේ ?"

"නැත්තේ නැහැ දරුව උපදින සතෙකු වෙත
මරණය පොදුයි උන්ටත් එහි වෙනස නැත"
"කිම මැරෙනවා නම් උපදින සියළු සත
මිය යන නිසා ඉපදීමක් ලැබෙනු ඇත"

"යළි නොඑන සේ මිය යන්නට බැරිද ?" කියා
කුමරා ඇසී. වාදය ගැඹුරටම ගියා
"බැරි නැහැ එහෙත් ඒ ගැන නොබැලුවෙමි සොයා"
ගුරු පැවසූහ නළලෙහි බැමි සඟල තියා

"ඒ ගැන ඉතින් ඔබ නොසොයන කරුණ කිම?"
"ජීවිත රහස එය වේ පුත ගැඹුරු තම"
"එහෙනම් ගුරුතුමනි ගිය පසු ළදරු කම
තනියම සොයා ගන්නම් ඒ රහස මම"

♦ **රජ්ගම - කිත්සිරි ගෝමස් ද සිල්වා**

*(කවියා විසින් 1967 දී **එහි පස්සිකො** නම් ලංකාවේ වෙසක් කලාපයකට ලියන ලද මේ කවි පෙළ ලංකාවිත්තියට පැරිස් නගරයේ සිට එවන ලද්දේ එහි වෙසෙන කිව්වරයාගේ ඥාති දියණියක විසිනි )*

# නිර්මාණ Nirmana

## නොනිවෙන පහන

ද ල් වා පහන පුදනට බුදුහිමි සිතැඟී
ස ල් පිල වෙත පැමිණි බැමිණිය මහළු දුගී
අ ල් ලට අඩ මසක් ගෙන කෙරුවාය ඉඟී
තෙල් බිඳුවක් මිළට ඉල්ලා දෙමස් අඟී

වෙතේ නුවර සිහමින් නිවසක් නොහැර
නැතේ කිසිත් ලැබුණේ අඩ මසක් හැර
පු තේ නුඹට පින් සිදුවෙයි අනෙක වර
අ තේ ඇති මිළට දෙනු තෙල් බිඳ මෙවර

කරු ණා වෙන් වෙළඳ දුන් තෙල් බිඳ රැගෙන
හැරුණා ඇය දෙසට බුදුහිමියන් වසන
පිරු ණා සැදැහැ සිත දෙව්රම් දුටු පමණ
පි දු ණා නොලස ගඳකිළියට තෙල් පහන

දුරු වූ ලෙසට ගඳකිළියෙහි ගණ අඳුර
හුරු වී නැණ එළිය මගෙ මතු දින සසර
හිරු එළිය මෙන් විනිවිදිනට බව කතර
පිරු වා පැතුම් බැමිණිය සිත එකහ කර

ප හ න දැල්වුණා මුළු රැය ගෙවෙන තුරා
නු සු න තෙල් එහෙත් තිබුණා පහන පුරා
නිවු ණ පහන් අළුයම අස්කරන යුරා
පැමිණ අනඳහිමියන් ගඳකිළිය කරා

නෙක අන් පහන් කුටියෙහි නොදිලෙන අතරා
දැ ක තවමත් දිළෙන තෙල් පිරි පහන පුරා
සැ ක සිතමින් පැමිණි දෙවියෙකු බුදුන් කරා
දැ ක ගන්නට පිදුවෙකැයි අළුයමට පෙරා

නොනිවෙන තෙල් පැවති පහනෙහි අසිරි ගැන
වි ම ස න විටදි සම්බුදු හිමියන් වෙතින
නැ ග එන බුදු මුවින් මඳහස් රැස් කඳින
හෙ ළි ව න ගඳකිළිය විහිදී දස දිගින

මතු දින කල්ප දස දහසක් පෙරුම් පුරා
බු දු ව න මහසතෙක් ලොව මොහො අඳුර ඉරා
සපැමිණ සවස පුද දුන් ගඳකිළිය කරා
එ ප හ න අනඳයෙනි දුටුවද අසිරි සරා

♦ **වෛද්‍ය උපාලි අබේසිරි**
**Middx UK**

## දඹදිව වන්දනාව

බුදුන් උපන් බිම වෙත ආ මුල් දවස
හද පතුලටම දැනුණා නිවනේ පහස
දුරුකර දමා අපගේ දුක් දොම් නස්ස
පළමු දවසෙ වැන්දා අප සංකස්ස

සල් මල් පිපී සුවඳින් අතු ඉති නැර
බෝසත් උපත ගැන කිව්වා ගම් බීර
සිහිකර සිදුවීම අති උත්තම වීර
ලුම්බිණියටයි අපගේ බැති උප හාර

වජිරාසනය මත වැඩසිටි බෝ සත්තු
දුකඳුරු නිවා තුන් ලෝකය ජය ගත්තු
සිරිලංකාවෙ සිට ආ අප පින් වත්තු
බැතිබර සිතින් සිරිමාබෝ වැඳ ගත්තු

සම්බුදු ජයන්තිය ගැන සිතුවිලි පහදා
බුදුහිමි දෙසූ දම්රස මතකයෙ රන්දා
දම්සක් පවත්වන සූතුරේ බල විහිදා
තුන්සිත පහදමින් ඉසිපතනය වැන්දා

අවුරුදු අසූවක් ගෙවූ දිවි ගමන පුරා
කළ සේවාව ලෝ සත වෙත ඉවර කරා
සිහිකර පිරිනිවුම නුවරදි කුසි නාරා
අප වැන්දා අප බුදුහිමි කඳුළු පෙරා

දෙව්රම වෙතට ගොස් අප තුන්සිත පහදා
කරඬුව හිසට ගෙන සතුටින් දොහොත බැඳා
සුවඳ කපුරු තෙල් මල් හා පහන් පුදා
අති උත්තම බුදු හිමියන් අපි වැන්දා

දඹදිව ගොසින් කවුරුන් හෝ වෙහෙස දරා
ලුම්බිණී ගයා ඉසිපතනය කුසි නාරා
වැන්දොත් සතර තැන් බුදුගුණ සිතේ දරා
ළං වේ සැවොම අජරාමර නිවන කරා

♦ **කුමාරි විජේරත්න**
Hounslow Middx **UK**

## අගාධයේ අද්දර සිට

**අඳුරු මූසල ගුබ්බැයමක**
**සොඳුරු නිකසල උණුසුමකු සෙවූ**
**ගන්දබ්බයෙක් මට හමුවුණා**
**මම සිනාසුණා ඔලොක්කුවට**
**හේ පෙරලා මට හිනාවුණා....**
**ඒත් ඔලොක්කුවටට....**

♦ **ගාමිණී පෙරේරා**
**Newcastle-under - Lyme - UK**

*අපේ පාඨක හා ලේඛකයන් වෙතටයි - මෙම නිර්මාණ පිටුවේ පළකිරීම සඳහා ඔබේ කාව්‍ය රචනා 2 වන පුටුවේ ඇති අපේ ලිපිනයට එවන්න.*